
# දම් පාටින් බැස නොයනා සඳකි ඔබ
# "සොඳුරු ගාන්ධර්වයාණනි"



කැළණි නිම්නයේ අවිස්සාවේල්ලට නුදුරු ගුරුගල්ලේ, යාලගම ඇයගේ උපන් ගම් ප්‍රදේශයයි.

මේ සොඳුරු නිම්නයේ සීතාවක මහා විද්‍යාලයේ ඉගෙනීම ලබන ඇය අවසානයේ සංගීතාචාර්යවරියක ලෙස සිසුනගේ නැණ නුවණ පෑදීමට යොමුවන්නීය. ඒ කොළඹ මහානාම විද්‍යාලයේයි. විවාපත් ව පුතකු සහ දියණියක ලබනා ඇයගේ ආදරණීය සැමියා ද එම විදුහලේම සංගීතාචාර්යවරයෙකු ව හෙළ ගී පුරාවතට අගනා තනු රැසක් නිර්මාණය කර දී හදිසියේ වියෝ වෙයි. ඇය ලියන්නීය ''සිය




සැමියා'' පිළිබඳව ග්‍රන්ථයක්. සැබැවින්ම ඒ සැමියාගේත් ඇයගේත් පෞද්ගලික දිවිය පමණක් ම නො වේ. රසික දනන්ගේ රස භාවයන් නංවමින් ඔහු ගෙවූ නිර්මාණාත්මක දිවිය පිළිබඳව ද පාඨකයින් දැනුවත් කරන ග්‍රන්ථයකි ඒ. ඇය මෙවර ''ගී සඳලුව'' ට ඇරයුම් ලබන්නේ විශ්‍රාමික සංගීතාචාර්යවරියක ගත් කතුවරියටක මතු නොව තරුණ සංගීත වේදියෙකුගේ මව ද ලෙසින්.

- ඇය නමින් අචිරවතී යාලගම.
- අචිරවතී මහත්මියගේ ප්‍රියාදර සැමියායි, දිවංගත ඔස්ටින් මුණාසිංහ සංගීතවේදියාණන්.
- ඔවුන් දෙපළගේ පුත් රුවනයි තරුපති මුණාසිංහ සංගීත වේදියාණන්.
- ස්වේතකී නමින් දුවක ද ඔවුනට වෙයි.

විශාරද ගුණදාස කපුගේ සහ විශාරද මාලනී බුලත්සිංහල ශිල්පී යුවල ගැයූ "දම් පාටින් ලා සඳ බැස යනවා" (රචනය - ලූෂන් බුලත්සිංහල), නිරෝෂා විරාජිනී ශිල්පිනිය ගැයූ "පුන් සඳ රෑට" (රචනය - රත්න ශ්‍රී විජේසිංහ) විශාරද නන්දා මාලනිය ගැයූ "ආලය වන්", "පානම් පත්තුවේ ඩිංගිරි අම්මාය", "හිතුමතේට දීග ගිය දුවේ" (රචනය - මහාචාර්ය සුනිල් ආරියරත්න) විශාරද මාලනී බුලත්සිංහල ගැයූ "මා එරක්කලා අමනාපව" (රචනය - ප්‍රේමකීර්ති ද අල්විස්) සේනානාක වේරලියද්ද ගායනා කළ "නංගිට බැඳපු මල් වියනයි" (වන සරණ ටෙලි නාට්‍යයට - රචනා කලේ තිස්ස අබේසේකර) විජේරත්න වරකාගොඩ සහ අනුලා බුලත්සිංහල ගැයූ " රඟහල දැන් ඇත අඩ අඳුරේ" (හඩ්සන් සමරසිංහ) වැනි ගීත රැසකම තනුව හා සංගීත නිර්මාණ කළේ ඔස්ටින් මුණාසිංහ සංගීතවේදියායි. මේ අතර අනුලා බුලත්සිංහල ගැයූ "දී කිරි දී කිරි" (රතු හැට්ටකාරී නාට්‍යය සඳහා ලූෂන් බුලත්සිංහල) ජය ශ්‍රී චන්ද්‍රජිත් ගැයූ "යස ඉසුරු" (රතුහැට්ටකරී නාට්‍යයට ලූෂන් බුලත්සිංහල) රොඩ්නි වර්ණකුල ගැයූ "හා හා ලඳේ" (බිසො නාට්‍යය සඳහා හෙක්ටර් කුමාරගේ) වැනි වේදිකාව වෙනුවෙන් නිර්මාණය වුණ ගීත ඔස්ටින් මුණාසිංහයන්ගේ අනන්‍යතාවය රසික ප්‍රේක්ෂකයිනට මොනවට පසක් කර දෙයි.

''සැන්දෑවේ පාසල් වත්තේ වගා කටයුතු සඳහා එන සිසුන් හට නිරන්තරයෙන් ඇසෙන්නේ ගුරු නිවසින් එන වයලීන නාදයයි. අනෙකුත් සිසුන් සමග පැසලට එන ඔස්ටින් වගා කිරීම පසෙක තබා වයලින් නාදය අසා හිඳී. හඬ ඇසූ මුත් කිසිදා නොදුටු මෙම භාණ්ඩය දැක ගැනීමේ කුහුලින් දිනක් ඔහු ගුරු නිවසේ කවුළුවෙන් ගුරුතුමා වයලීනය වයන හැටි බලා උන්නේය. ජනේලයෙන් එබී තමා වයලීනය වයන සැටි බලා හුන් මේ ළමයා කවරකුදැයි ගුරුතුමා හඳුනා ගත්තේය. "මුණාසිංහ මොකද ඔතන ?" (17 වන පිටුව)

සොඳුරු ගාන්ධර්වයාගේ මියැසි සංවේදීතිවය පිළිබඳව මුලින් ම හඳුනාගන්නට ලැබුණ සිද්ධිය අචිරවතී යාලගම කතුවරිය සටහන් තබන්නේ ඒ අන්දමටයි.

''පුරාණ සත් පත්තිනි දේවාල පිහිටියේ මුණාසිංහ නිවසට හුවක දුරින්. දේවාලයේ තේවාව පවත්වන විට වැයෙන හේවිසි හඬ ඇසූ සැණින් ඔස්ටින් සිටින්නේ දේවාල බිමෙහිය. දේවාලයේ ප්‍රධාන කපු මහතා ඥාතියෙකු වූ හෙයින් දේවාලයට යාම ගෙදර අයට ප්‍රශ්ණයක් නොවීය. තේවාව අවසානයේ සමහර දිනක බෙර වාදකයෝ ඒවා වැයීමට ඔස්ටින්ට අවස්ථාව ලබා දුන්නේ කාටත් හොර රහසිනි. (22 පිටුව)

ඔස්ටින් මුණාසිංහ සංගීතවේදියාණන් වඩාත් ඉහළින් හදාරා දස්කම් පෑ තාල වාද්‍ය භාණ්ඩ වැයීමට පෙර හුරුව ලැබූ අන්දමයි ඒ.

ගැ. දම්පාටින් ලා සඳ බැස යනවා
ආකාසේ රන් වන් පාටයි
සමුගෙන යන්න මගෙන්
තව මොහොතයි
නො දොඩා ඉන්නේ ඇය ?

පි. දම් පාටින් සඳ මුහුණ දිළෙනවා
වෙන් වී යන මොහොතක් නෑගෙයි
දෑසට ලංව තවත් මේ මොහොතේ
ගොළු වී ඉන්නෙමි මං

ගැ. සෙවනැළි නොමැකේ නම්
එළිය කළු නො වේ නම්
බිත්ති පුරා ඔබෙ සෙවනැලි ඇන්ද්
තනිය මකා ගන්නයි
එනතුරු සොයා මගේ සෙනෙහස මතු
දා

පි. රෑ කල දිගු වේ නම්
ළා සඳ නො මැකේ නම්
නෙළුම් පතක රැඳි පිනි බිඳුවක් සේ
ළමැද තලා යහනේ ඉන්නම්
පමා වෙලා හිරු නැගෙන තුරා

ගායනය : විශාරද මාලනී බුලත්සිංහල සමග විශාරද ගුණදාස කපුගේ
සංගීතය : ඔස්ටින් මුණාසිංහ
රචනය : ලූෂන් බුලත්සිංහල

ඔස්ටින් මුණාසිංහ සංගීතවේදියාණන්ගේ සමීපතම චරිතය ලෙස මේ තොරතුරු " සොඳුරු ගාන්ධර්වයා" ග්‍රන්ථයට කැටි කළ පිය බිරිඳ, අචිරවතී යාලගම කතුවරිය මේ දිනවල විශ්‍රාම සුවයෙන් සිටින්නේ සිඩ්නි නුවර වසන සිය දියණිය, ස්වේතකී සමඟයි. "ගී සඳලුව" වෙනුවෙන් ග්‍රන්ථය පිළිබඳව කෙටි පිළිසඳරකට එක් වූවාය ඇය දුරකථනයෙන්.



සිසිර
දිසානායක

"සොඳුරු ගාන්ධර්වයා පොත ලියන්න මාව පොළඹවපු හේතු කීපයක් ම තිබුණා." ඇය අපගේ විමසීමට පිළිවදන් දෙමින් හඬ අවදි කළාය.

"ඔස්ටින් මුණාසිංහයන්ගේ අභාවයෙන් පසුව ඔහුගේ බොහෝ ගීත මංකොල්ලකරුවන්ට ගොදුරු වෙලා තිබුණා. ඒ ගීත සුරැකීම මගේ යුතුකමක් විදියට හිතලයි පොත ලියන්න මුලින් ම හිතුවේ. ඔස්ටින් මුණාසිංහයන්ගේ 35 වසරක නාට්‍ය ජීවිතයේ මිහිරි මෙන්ම අමිහිරි අත්දැකීම් ද හෙළි කිරීම ඔහුට පුදන බුහුමනක් විදියට මම හිතුව නිසා ඒ දේවල් ද මේ පොතට ඇතුලත් කලා."

''2016 අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පැවැත්වුණ පොත් ප්‍රදර්ශනයේදී සොඳුරු ගාන්ධර්වයා පොත අපි එළි දැක්වූවා. ප්‍රවීණ නාට්‍ය අධ්‍යක්ෂක ජයලත් මනෙ-්රත්න, ප්‍රවීන නාට්‍ය අධ්‍යක්ෂක ලූෂන් බුලත්සිංහල මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙනුයි මේ උළෙල එදා පැවැත්වුණේ. සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ කුලපතිතුමන්ටයි පොත පිළිගැන්නුවේ.

''ඒ උත්සවයේදී නිරෝෂා විරාජනී ''පුන්සඳ රෑට'' අනුලා බුලත්සිංහල ''දීකිරි දී කිරි'' සේනානායක වේරලියද්ද ''නංගිට බැඳපු මල් වියනයි'' ඉන්දීවරී ආරියසිංහ ''ලෙන්චිනා'' රොඩ්නි වර්ණකුල ''හා හා ළඳේ'' රත්නා ලාලනී ''මනවරනිඳුන්ට'' නිශ්ශංක දිද්දෙණිය ''සසදර මනනන්ද' ත්‍යාගා එන්. එඩ්වඩ් ''එදා මෙන්ම'' ගීත ගායනා කරලා හැමෙ-්වම මුණාසිංහ ගාන්ධර්වයාගේ සංගීතයෙන් පිනෙව්වා.

''සොඳුරු ගාන්ධර්වයා'' ග්‍රන්ථය එළිදැක්වීමෙන් අනතුරුව ඊට ලැබෙනා ප්‍රතිචාර පිළිබඳවද සිහිපත් කරනා අචිරවතී යාලගම කතුවරිය:

''පුස්තකාල සේවා මණ්ඩලය මේ පොත පාසල් පුස්තකාල සඳහා සුදුසු පොතක් විදියට නිර්දේශ කළා. කතෘ ප්‍රකාශන මිළ දී ගැනීමේ ව්‍යාපෘතිය යටතේ සංස්කෘතික දෙපාර්තමේන්තුව රුපියල් 25000 ක පොත් මිළ දී ගත්තා. පුස්තකාල සේවා මණ්ඩලයත්, කොළඹ මහජන පුස්තකාලයත් ඒ ව්‍යාපෘතිය යටතේම පොත් මිළ දී ගත්තා." සිය ග්‍රන්ථය පාඨකයින් අතරට යාම පිළිබඳව ඇයට ඇත්තේ මහත් සතුටක්. අපි ඇයට සන්නස පාඨකයින් වෙනුවෙන් ස්තුතිවන්ත වූ අතර අවසන සුබ පැතුවෙමු.